**ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2013**

---

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය ව්‍යාචනය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම**

---

මණ්ඩලයට අයත් වතු 17 අතුරින් වතු 16 ක් අඛණ්ඩව අලාභ ලැබීම මත 2012 දෙසැම්බර් 31 දිනට පැවති රු.252,874,365 ක්වූ ශුද්ධ වත්කම් 2013 දෙසැම්බර් 31 වනවිට රු.298,188,624 ක් වූ සෘණ අගයක් දක්වා අඩු වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙම ශුද්ධ වත්කම්වල අඩුවීම සියයට 218 ක් වූ විශාල ප්‍රතිශතයක් විය. මෙයට අතිරේකව වාර්තාවේ 2.2.7 සහ 3.3 (අ) ආදි කරුණු සැලකිල්ලට

ගතහොත් මෙම තත්ත්වය තීව්‍ර වන බව පෙනී යයි. මේ අනුව රජයේ හෝ වෙනත් මූල්‍ය සහයක් නොමැතිව මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යෑම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

**2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 අනුව ආයෝජන වත්කම් ලෙස හඳුනාගත යුතු වත්කම් හඳුනා නොගෙන ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක කල යුතු නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත (SLRFS) හා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) වලට අනුකූල වෙමින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 01 ( SLRFS 01) පරිදි 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලද ප්‍රථම වරට අනුගතවීම (First Time Adoption) සිදු කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නාගස්තැන්න වතුයාය සහ පුද්ගලික සමාගමක් සමඟ බද්ධ ව්‍යාපාරයේ 2008 වර්ෂය තුල දරන ලද වියදම් සහ තේ තැරැව්කරුවන්ට කළ වියදම් එකතුව රු. 2,176,683 ක් ලැබිය යුතු මුදලක් ලෙස ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) වතු අංශය විසින් හඳුනාගෙන තිබූ රු. 50,735,840 ක් වූ ගෙවිය යුතු සේවක අර්ථසාධක අධිභාර, වියදම් ලෙස ගිණුම් ගත නොකර වතු පාලන ගිණුමකට හර කර තිබුණි.

(ඇ) ගලහ, බෝපිටිය, කන්දල්ඔය හා හෝප් වතුයායන්ට අදාළව ගණනය කරන ලද රු.14,775,049 ක් වූ පාරිතෝෂික අධිභාර ප්‍රමාණය අදාල වතුවල නිෂ්පාදන වියදමක් ලෙස සලකා තිබුණි.

(ඈ) විවිධ ලැබිය යුතු ශේෂය වූ රු. 3,202,747 තුළ රු. 2,496,613 ක් වූ තුලනය නොකරන ලද වැටුප් පාලන ගිණුමේ ශේෂයද ඇතුලත් කර තිබුණි.

(ඉ) බදු දී තිබූ ගොඩනැගිල්ලක් වෙනුවෙන් 2010 නොවැම්බර් සිට අයවිය යුතුව තිබූ රු. 2,931,188 ක් වූ බදු මුදල ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.4 නොසැසඳූ පාලන ගිණුම් හා අවිනිශ්චිත ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වතු 4 කට අදාළව ගිණුම්වල දක්වා තිබූ පාරිතෝෂික අධිභාර, උපලේඛන සමග සැසඳීමේදී රු.5,541,963 ක වෙනසක් හා සේවක අර්ථසාධක අධිභාර වියදම් ලෙජර් ගිණුම හා අවසන් ගිණුම අතර රු. 776,042 ක වෙනසක් නිරීක්ෂණය විය.

---

(ආ) මොන්ත ක්‍රිස්තො වතුයාය බදු පදනම මත ලබා දී තිබූ පුද්ගලික ආයතනයෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බදු කුළිය රු. 5,101,794 ක් වුවද එය ගිණුම් අනුව රු.784,800 ක් විය. වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලය හා එක් එක් වතුවලට අදාල වූ හඳුනා නොගත් හර හා බැර ශේෂ පිළිවෙලින් රු.11,194,109 හා රු.5,082,066 විය.මෙම ශේෂ දීර්ඝ කාලයක් තිස්සේ අවිනිශ්චිත ගිණුම් ශේෂ ලෙස ඉදිරියට ගෙනත් තිබූ නමුත් එම ශේෂ හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| (අ) ජංගම නොවන වත්කම් | 2,100,288,935 | (i) උපලේඛන<br>(ii) ස්ථාවර වත්කම් ලේඛනය<br>(iii) සමීක්ෂණ මණ්ඩල වාර්තා<br>(iv) හිමිකම් සහතික පත්‍ර |
| (ආ) ක්ෂය වෙන්කිරීම් | 400,575,027 | ගණනය කිරීමේ උපලේඛන |
| (ඇ) අවසාන තොගය | 95,736,379 | තොග සමීක්ෂණ වාර්තා |
| (ඈ) වෙළඳ ලැබිය යුතු | 154,302,296 | (i) උපලේඛන<br>(ii) ශේෂ සනාථ කිරීම් |
| (ඉ) විවිධ ණයගැතියෝ | 131,908,927 | (i) උපලේඛන<br>(ii) ශේෂ සනාථ කිරීම් |
| (ඊ) තැන්පතු | 1,088,935 | තැන්පතු සහතික |
| (උ) වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය | 4,136,732 | ප්‍රතිපූර්ණය සඳහා යවන ලද වියදම් විස්තර වාර්තා. |
| (ඌ) ලැබිය යුතු බදු කුලී | 5,935,240 | උපලේඛන |
| (එ) අමු තේ දළු සඳහා වූ ණයගැතියෝ | 20,538,071 | (i) උපලේඛන<br>(ii) කාල විශ්ලේෂණය |
| (ඒ) සේවක අර්ථසාධක අරමුදල/සේවක | 719,149,421 | (i) උපලේඛන<br>(ii) හිමිකරුවන්ගේ ශේෂ |

| | | | |
|---|---|---|---|
| | භාරකාර අරමුදල/ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමය/ වතු සේවක අර්ථසාධක සංගමය | | ලැයිස්තුව |
| (ඔ) | පාරිතෝෂික වෙන්කිරීම් | 1,067,123,203 | උපලේඛන |

**2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවිධ ලැබීම් ලෙස දක්වා තිබූ රු.706,134 ක අගය ගිණුම් ශේෂ 20 ක එකතුවක් වන අතර එම ශේෂ වර්ෂ 5 ක පමණ කාලයක සිට ගැලපීම් කිරීමකින් තොරව පවත්වාගෙන ගොස් තිබුණි.

(ආ) ජනතා වතු අමාත්‍යාංශය නමින් ලැබිය යුතු ගොඩනැගිලි කුළී හා ආරක්ෂක ගාස්තු පිළිවෙලින් රු.1,225,841 ක් හා රු.305,321 ක් ණයගැතියන් ලෙස ගිණුම්ගත කර තිබුණද, වර්තමානයේ එම අමාත්‍යාංශය රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කර ඇති අතර මෙම ශේෂ අයවිය යුතු ලෙස තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනයේ ගොඩනැගිලි බදු පදනම මත ලබාදුන් පෞද්ගලික ආයතනයකින් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බදු කුළිය රු.20,432,822 ක් විය. මෙම මුදල අයකර ගැනීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව නමින් ඇති ගිණුම් 7 ක ලැබිය යුතු ශේෂයන්ගේ එකතුව රු.12,812,143 ක් වූ අතර, එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පෞද්ගලික සමාගමකින් හා පෞද්ගලික ආයතනයකින් අය විය යුතු බදු මුදල වන පිළිවෙලින් රුපියල් මිලියන 39 ක් හා රු.645,835 ක් 2014 ජුනි 6 වන දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.7 මූල්‍ය කළමණාකරනයේ දුර්වලතා**

නිසි පරිදි සැළසුම් සකස්කර හා වියදම් පාලනය කිරීමෙන් තොරව හා ලැබිය යුතු ආදායම් නියමිත පරිදි අයකර ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හා ප්‍රශස්ත මූල්‍ය සම්පාදන මාර්ග කෙරෙහි අවධානය යොමු නොකිරීම තුල මණ්ඩලය දැඩි මූල්‍ය දුෂ්කරතාවයකට මුහුණ දී ඇති බව නිරීක්ෂණය වූ අතර මෙම තත්ත්වය පහත කරුණු අනුව තහවුරු විය.

(අ) ව්‍යවස්ථාපිත බැඳීමක් පවතින ගෙවීම් නියමිත පරිදි ගෙවීමට නොහැකි වීම.

---

| | රු. |
|---|---|
| 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව කලයුතු ගෙවීම් | 333,672,565 |
| 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනත අනුව කලයුතු ගෙවීම් | 31,488,978 |
| 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව කලයුතු ගෙවීම් | 412,806,300 |
| 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත අනුව කලයුතු ගෙවීම් | 29,661,379 |
| 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත අනුව කලයුතු ගෙවීම් | 7,752,214 |
| 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව කලයුතු ගෙවීම් | 4,396,757 |
| | 819,778,193 |

(ආ) ගෙවීම් නියමිත පරිදි සිදු නොකිරීම හා ප්‍රශස්ත මූල්‍ය සම්පාදන තෝරා නොගැනීම නිසා පහත දැක්වෙන අතිරේක වියදම් දැරීමට මණ්ඩලයට සිදු වී තිබුණි.

| | රු |
|---|---|
| බ්‍රෝකර්වරුන්ගෙන් ලබාගත් අත්තිකාරම් සඳහා පොළී | 35,220,694 |
| බැංකු අයිරා පොළී | 11,431,313 |
| ගෙවීම් පහුකිරීම නිසා ගෙවූ දඩ මුදල් | |
| සේවක භාරකාර දායක මුදල් | 7,446,774 |
| සේවක අර්ථසාධක දායක මුදල් | 66,108,312 |
| වතු සේවක අර්ථසාධක දායක මුදල් | 175,264 |
| ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක දායක මුදල් | 148,131 |
| සේවක පාරිතෝෂික | 74,121,115 |
| විදුලි බිල් | 332,040 |
| වරිපනම් බදු | 854,308 |
| | 195,837,951 |

(ඇ) වෙනත් ආයතන වෙත සපයනු ලබන ගිවිසුම්ගත සේවා වෙනුවෙන් මුදල් ලැබීමේ දී එම ආයතන විසින් අඩු කරගෙන ඇති රඳවා ගැනීම් බදු ශේෂය රු.9,481,143 ක් වන අතර, එම ශේෂය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අයකර ගැනීමට හෝ හිලව් කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 272 (3) | සෑම ගෙවීම් වවුචරයක්ම ගෙවීම් සිදුකර සති 06 ක් ඉක්මවීමෙන් පසු විගණන කටයුතු සඳහා ඉදිරිපත් කළයුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි395 | බැංකු ජංගම ගිණුම්වලට අදාළ සැසඳුම් වාර්තා ඊළඟ මාසයේ 15 දිනට පෙර පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් එසේකර නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 756 හා 757 | සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පවතින මානව හා භෞතික සම්පත් පරීක්ෂා කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ඈ) මුදල් රෙගුලාසි 1646 | සෑම වාහනයකම ධාවන සටහන්වල මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ප්‍රධාන කාර්යාලයේ හා වතුයායන්ට අනුයුක්ත කර ඇති වාහන වල ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 06 කට වරක් ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත් මණ්ඩලයේ සියලුම වාහන සඳහා ඉන්ධන පරීක්ෂාව සිදු කර නොතිබුණි. |
| (ඊ) 2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 2 ක් පමණක් පවත්වා තිබූ අතර, එහි තීරණද ක්‍රියාත්මක කර නොතිබුණි |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.500,500,277 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.199,543,724 ක් විය.ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.300,956,553 කින් වැඩි වී තිබුණි. පසුගිය වර්ෂවලදී ගැලපීම් කර නොමැති රු.139,453,385 ක සේවක අර්ථසාධක හා පාරිතෝෂික අධිභාර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම, ගෙවිය යුතු පාරිතෝෂික සඳහා රු.72,631,318 ක ප්‍රතිපාදන වෙන් කිරීම සහ පාරිතෝෂික වෙන් කිරීම රු.182,463,654 ක් සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන ගිණුම්ගත කිරීම අලාභය වැඩි වීමට හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

| මූල්‍ය තත්ත්වය | 2013 | 2012 |
|---|---|---|
| ජංගම අනුපාතය | 1:2.9 | 1:2.4 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1:3.4 | 1:2.8 |

ජංගම වත්කම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය අනුව මණ්ඩලය ප්‍රශස්ත මූල්‍ය තත්ත්වයක නොපවතින බවට නිරීක්ෂණය විය.

**3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් හා සේවක අර්ථසාධක අරමුදල් නිසි පරිදි නොගෙවීම හේතුවෙන් කම්කරු කොමසාරිස් කාර්යාලය මගින් මණ්ඩලයට පවරා ඇති නඩු සංඛ්‍යාව 364 ක් වන අතර ඒ හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වන මුදල රු.322,905,437 ක් විය.

(ආ) බාහිර පාර්ශව විසින් මණ්ඩලයට එරෙහිව නඩු 47 ක් පවරා තිබුණි..

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී රු.1,532,149ක් නීතිඥ ගාස්තු වශයෙන් ගෙවා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

මණ්ඩලය විසින් තේ කිලෝ ග්‍රෑම් එකක් නිපදවීමේදී දැරීමට සිදුවන මූලික පිරිවැය, තේ කිලෝ ග්‍රෑම් එකක විකුණුම් ආදායමෙන් ආවරණය කරගත නොහැකි තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.ඒ අනුව 2013 වර්ෂයේ කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය (COP) කිලෝ ග්‍රෑම් එකක සාමාන්‍ය විකුණුම් වටිනාකම (NSA) හා ඒකක දායකය සැසඳීමේදී වතු 12 ක තේ කිලෝ ග්‍රෑම් එකක දායකයේ අලාභය රු.27 සිට රු.426 දක්වා වූ පරාසයක පැවතුණි.

---

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රථවාහන, කර්මාන්තශාලා ආදිය නඩත්තු කිරීමේදී එම නඩත්තු පිළිබඳ විස්තර ලේඛනගත කර පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබූ බැවින් එකම කාරණයක් සඳහා නැවත නැවත ගෙවීම් කිරීමෙන් වැරදි හා වංචා සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

(ආ) මනු නොමැතිව වතු නිල නිවාස වෙත කර්මාන්ත ශාලාවලින් විදුලිය සැපයීම හේතුවෙන් නිල නිවාසයන්ට අදාළව ගෘහස්ථ විදුලි පරිභෝජනය කොතරම්ද යන්න ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) අංක 320 ඩාර්ලි පාරේ පිහිටි දේපල බදු දීමට අදාළව බදුකරුවන් තෝරා ගැනීම තරඟකාරී පදනමක් මත සිදු වී නොතිබුණු අතර අදාළ දේපල රජයේ තක්සේරුකරුවන් විසින් තක්සේරුකර නොතිබුණි. තවද දේපල බදුදීමට අදාළ අංක 122 දරන බදු ගිවිසුම ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි.

(ඈ) ව්‍යාපෘති ඇගැයීමක්, ශක්‍යතා අධ්‍යනයක් හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් හෝ ලබා නොගෙන රු.2,593,180 ක් වැය කර හෝප් වතුයායේ පානීය ජල බෝතල් ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණු අතර, පසුව එය අතහැර තිබුණි.

(ඉ) මුල්හල්කැලේ වතුයායේ මාසික වියදම් ඉදිරියටත් දැරීමට සිදුවන තත්ත්වයක් යටතේ එම වතුයාය අක්‍රිය තත්ත්වයෙන් පවත්වාගෙන යාම වෙනුවට ආයතනයේ ආයෝජනයක් මගින් ප්‍රතිසංවිධානය කිරීමට හෝ පෞද්ගලික අංශයේ මැදිහත් වීම මත ආයතනයට යම් ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට සංවර්ධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජනවසම "ජන තේ" අලෙවියෙන් සියයට 90 සිට සියයට 95 ක පමණ නියෝජනයක් පැවති යුධ හමුදාවට අලෙවි කරනු ලබන තේ මිල ඉහල දැමීම පදනම් විරහිත නිසා 2013 ජූලි මාසයේ සිට ඇණවුම් කිරිම නැවතී තිබුණි. ඒ හේතුවෙන් ආයතනයට වාර්ෂිකව රු. 40,320,000/- ක ඇස්තමේන්තුගත අලාභයක් සිදුවී තිබුණි.

(ආ) අමු තේ දළු පෞද්ගලික අංශය වෙත අලෙවි කිරීමේදී මුළු බරෙන් වතුර බර, තාර බර හා මේරූ දළු සඳහා අඩු කරනු ලබන ප්‍රතිශතය විවිධ අවස්ථාවන්හිදී වෙනස්වී තිබුණි.

(ඇ) විවෘත තරඟකාරී පදනමක් මත ගැණුම්කරුවන් තෝරා ගැනීමකින් තොරව සහ ගිවිසුමකින් තොරව 2012 සහ 2013 වර්ෂවලදී පිළිවෙලින් තේ කිලෝග්‍රෑම් 2,075,500 ක් සහ කිලෝග්‍රෑම් 2,840,401 ක් ද පෞද්ගලික අංශයට අලෙවි කර තිබුණි.

(ඈ) තේ නිෂ්පාදනයේදී මුළු නිෂ්පාදනයෙන් සියයට 70 ක් පමණ ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩයන්ගෙන් සමන්විත විය යුතු වුවද හෝප් වතුයායේ කර්මාන්ත ශාලාවේ පවතින දුර්වලතා හා තේ දළුවල ගුණත්වය අඩු මට්ටමක පැවතීම හේතුවෙන් ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩයේ දායකත්වය මුළු නිෂ්පාදනයෙන් සියයට 50 දක්වා අඩු වී තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

රොක්වුඩ් වතුයායේ 2009 හා 2010 වර්ෂවල ආරම්භ කරන ලද තේ පැළ 53,113 කින් සමන්විත පැළ තවාන 2013 ජූනි මාසය වන විටත් ක්ෂේත්‍රයේ රෝපණය නොකර තවාන් මට්ටමේ පවත්වාගෙන ගොස් තිබුණි. පැළ තවානක් ආරම්භ කර මාස 09 ක් ගත වන විට එම පැළ ක්ෂේත්‍රයේ රෝපණය කිරීම ආර්ථික වශයෙන් ඵලදායික වන අතර මෙම පැළ තවාන් පිළිවෙලින් වර්ෂ 5 ක් හා 4 ක් තවාන් මට්ටමේ පවත්වාගෙන ගොස් තිබුණි.

## 4.5 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වසර 10 ක කාලයක් තුළ කන්දල්ඔය තේ කර්මාන්ත ශාලාව වසා දමා ඇති අතර කර්මාන්ත ශාලාවේ සේවකයින් තිදෙනෙකුට ඵලදායී සේවාවක් ලබාගැනීමකින් තොරව 2003-2013 කාල පරිච්ඡේදය තුළ රු.7,742,280 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) රහතුන්ගොඩ වතුයායට කිලෝමීටර් 45 පමණ දුරින් පිහිටි අක්‍රීය මුල්හල්කැලේ වතුයායේ කොටසක් රහතුන්ගොඩ වතුයායේ කොටසක් ලෙස පාලනය කිරීම මත ජනතා වතු සංවර්ධන මණ්ඩලයට කිසිදු ආදායමක් නොලබා 2010 ජනවාරි සිට 2013 මැයි දක්වා සේවක වැටුප් ලෙස රු. 13,404,947 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත වාර්ෂික ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද මණ්ඩලය විසින් 2013 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2014 ජුලි 01 දින දීය. 2005 වර්ෂයේ සිටම මෙසේ ගිණුම් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

2011 - 2013 දක්වා වූ සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබුණද, ආයතනයේ පවතින අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු අත්හිටුවීමට 2011 ඔක්තෝබර් 07 දින රැස් වූ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක 12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වුවත්, අභ්‍යන්තර විගණන සැලසුම් හා අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

---

## 5.5 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෞද්ගලික ආයතනයකට කුලියට දී ඇති ඉඩම සහ ගොඩනැගිල්ල වෙනුවෙන් අය විය යුතු රු. 8,215,722 ක් වූ බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) හෝප් වතුයායේ 2012 වර්ෂයට අදාළ පාරිතෝෂික වියදම වන රු. 1,038,553 ක ප්‍රමාණය වියදම් ගිණුමේ සටහන් නොකර ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුමේ සටහන් කර තිබුණි. මෙම වරද 2013 ගිණුම් තුළින්ද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට ගැළපුම් ගිණුමේ ශේෂය වූ රු. 2,261,885 ක් 2013 වර්ෂයේ ගිණුම් වලින්ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රොක්වුඩ් වතුයාය

(i) වතුයායේ පොදු ලෙජරයේ රු.10,304,340 ක හර ශේෂයන්ගෙන් සමන්විත ගිණුම් 35 ක් අක්‍රියව පැවතුණු අතර, රු.1,628,097 ක වටිනාකමකින් යුත් බැර ශේෂයන් සහිත ගිණුම් 27 ක් ද අක්‍රියව පැවතුණි.මෙම ශේෂයන් වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එනු ලැබූ ගිණුම් වූ අතර, 2013 වර්ෂයේ මෙම ගිණුම් සඳහා අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2012 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය අනුව ගැලපුම් ගිණුමේ ශේෂය රු.8,811,646 ක් විය.එම ශේෂය නියෝජනය වන්නේ කුමන ගිණුම් හර හා බැර වීමෙන්ද යන්න සනාථ කර ගැනීමට සාක්ෂි නොතිබුණි.එසේම එම ගිණුම් ශේෂ තනි ගිණුමකට ගැනීමේ අරමුණ හා එසේ කිරීමට අධිකාරී බලය ලබාදීම සම්බන්ධව තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඈ) රහතුන්ගොඩ වතුයාය

(i) වතුයායේ අමු තේ දළු Rossling Hill කර්මාන්ත ශාලාවට ලබාදීම වෙනුවෙන් 2006 වර්ෂයේ සිට වතුයායට අයවිය යුතු රු 555,890.ක මුදල අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) තොග මිලදී ගැනීමේ අවිනිශ්චිත ගිණුම් ශේෂය 2012 දෙසැම්බර් 31 දිනට රු.1,554,872ක් විය. එම ගනුදෙනු හඳුනාගෙන ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කන්දල්ඔය වතුයාය.

(i) 2009 වර්ෂයේදී ඕනුගල් ඔය තේ කර්මාන්ත ශාලාව වෙත ලබාදුන් අමු තේ දළු වෙනුවෙන් අයවිය යුතු රු.148, 896 ක් අයකර ගැනීමට ආයතනය මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ii) තොග මිලදී ගැනීමේ අවිනිශ්චිත ගිණුමේ ශේෂය 2012 දෙසැම්බර් 31 දිනට රු.2,735,704 ක් විය. එම ගනුදෙනු හඳුනාගෙන ගැළපීම් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

------------------------------------------------------------------------------------------------------------

**6. පද්ධති හා පාලන**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු විය යුතුය.

(අ) පොත්පත් හා ලේඛන පවත්වාගෙන යාම.
(ආ) බදු කුළී ආදායම් එකතු කර ගැනීම.
(ඇ) ගිණුම්කරණය.
(ඈ) ණයගැතියන් හා ණය හිමියන්.
(ඉ) ස්ථාවර වත්කම්.
(ඊ) ආදායම්.